ආර්ථිකයේ ප්‍රතිලාභ සෑම ස්ථරයකටම බෙදී යා යුතුයි

i. **කර්මාන්ත, සේවා හා කෘෂිකර්මාන්ත අංශවල නිෂ්පාදනය වර්ධනය.**
ii. **මෙම නිෂ්පාදනය සඳහා ජනතාවගේ සක්‍රිය දායකත්වය සහ සහභාගිත්වය ඇතිව සිදුවිය යුතු වීම.**
iii. **නිෂ්පාදනයෙන් ලැබෙන ප්‍රතිලාභ සහ වර්ධනයන් සමාජය පුරා සාධාරණව බෙදී යා යුතු වීම.**
ඒ හා සමානව, භාණ්ඩ හා සේවා සඳහා ඉල්ලුම සැලකීමේ දී රජයේ ප්‍රතිපත්ති අරමුණු වන්නේ;
i. **අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා අඛණ්ඩව සැපයීම සහතික කිරීම.**
ii. **එවැනි භාණ්ඩ හා සේවා සාධාරණ මිලකට සැපයිය යුතුවීම.**
iii. **භාණ්ඩ හා සේවා පිළිගත හැකි මට්ටමේ ගුණාත්මක බවකින් යුක්ත විය යුතුය යන්නයි.**
මෙම සැපයුම සහ ඉල්ලුමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ යන්ත්‍රණය පහත සඳහන් සියල්ලෙහි එකතුවක් වනු ඇති.
i. **වෙළෙඳපොළ බලවේග ඔස්සේ සැපයුම, ඉල්ලුම සහ මිල තීරණය කරනු ලබන තරගකාරී වෙළෙඳපොළ.**
ii. **නියාමනය: එහිදී රජය විසින් නියාමන ආයතන හරහා වෙළඳපොළ නියාමනය කිරීම.**
iii. **ඇතැම් ක්ෂේත්‍රවල, සැපයුම සහ ඉල්ලුම සඳහා සක්‍රිය රාජ්‍ය සහභාගිත්වය.**
iv. **සමහර ක්ෂේත්‍රවල නිෂ්පාදන සංවිධාන කිරීම.**

මෙවර අය වැය මෙම මූලධර්ම මත පදනම්ව සකස් කර තිබෙන අතර, සියලුම පුරවැසියන් ක්‍රියාකාරී සහභාගිවන්නන්, ක්‍රියාකාරී පාර්ශ්වකරුවන් සහ ක්‍රියාකාරී ප්‍රතිලාභීන් වන ආර්ථිකයක් නිර්මාණය කිරීමට පදනමක් සැකසීමට අප අදහස් කරනවා. රජයේ කාර්යභාරය වන්නේ මිනිසුන්ට තම ආර්ථික විභවයන් සපුරා ගැනීමට ඇති බාධා ඉවත් කර පහසුකම් සැලසීමයි. දුෂ්කර ප්‍රදේශයක ජීවත්වීම හේතුවෙන්, යම් පුද්ගලයකු ආබාධිතභාවයක් හේතුවෙන්, අධ්‍යාපන අවස්ථා හිඟකම හේතුවෙන්, මූලික යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන් තම ආර්ථික හැකියාව සපුරා ගැනීමට නොහැකි වූ විට එය අසාධාරණයක්. මෙය එක රැයකින් විසඳිය හැකි පහසු ක්‍රියාවලියක් නොවෙයි. පුරවැසියන් ඔවුන්ගේ ආර්ථික විභවයන් සපුරාලීම සඳහා බලගැන්වීම සඳහා විශාල උත්සාහයක් අවශ්‍ය වනවා. මෙහිදී ජනතාවගේ අවශ්‍ය කුසලතා සහ ධාරිතාව ගොඩනැඟීම සඳහා අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ආයෝජනය කිරීම වැදගත්. මිනිසුන්ට ඔවුන්ගේ හැකියාවන් සපුරාලීමට අවස්ථාව ඇති බව සහතික කිරීම සඳහා සෞඛ්‍ය සේවා සඳහා ආයෝජනය කිරීම අත්‍යවශ්‍යයි. ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට සහ ආර්ථික අවස්ථා සමඟ සම්බන්ධ වීමට ජනතාවට හැකිවන පරිදි යටිතල පහසුකම් සැපයිය යුතුයි. සැමට සම අවස්ථා නිර්මාණය කරන වෙළෙඳපොළ බලයේ අධික සංකේන්ද්‍රණයක් නොමැති ලෙස තරගය සාධාරණ වන බවට රජය විසින් සහතික කළ යුතුය. මෙම අය වැය යෝජනා මඟින් මේ රටේ ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම ආරම්භ කරනවා. මෙය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රජාතාන්ත්‍රීකරණය සඳහා පදනම වනු ඇති.

අඛණ්ඩ ඵලදායිතා වර්ධනය සඳහා ආර්ථිකය ඩිජිටල්කරණය අත්‍යවශ්‍යයි. ආර්ථික ප්‍රගමනය සඳහා පමණක් නොව, සමාජ නඟාසිටුවීම සහ දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා වන තවත් තීරණාත්මක පදනමක් වන්නේ යහපත් ආණ්ඩුකරණය සහ දූෂණය ඉවත් කිරීමයි. යහපත් ආණ්ඩුකරණය සඳහා වන ප්‍රතිසංස්කරණ සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග අප රජයේ ප්‍රධානතම ප්‍රමුඛතාවන් වෙනවා. මෙම අභිලාෂයට ජීවය ලබා දීම ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනේ අරමුණයි.

මධ්‍යකාලීන සාර්ව ආර්ථික දිශාව

මෙවර අය වැයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා සමඟින් අපි සාර්ව ආර්ථික ගමන් මාර්ගයේ නව පෙරළියකට අඩිතාලම දමමින් සිටිනවා. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 5 කට වඩා වැඩියෙන් අපි මැදිකාලීනව අපේක්ෂා කරනවා. ආර්ථිකයේ සැපයුම් ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා අප ගනිමින් සිටින ක්‍රියාමාර්ග තුළින්, මිල නිසා හටගත හැකි කම්පන අවම කර ගැනීමටත්, එමඟින් අඩු සහ ස්ථාවර උද්ධමනයක් තවදුරටත් පවත්වා ගැනීමටත් අපි අපේක්ෂා කරනවා. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාර්ගය, විශාල ජංගම ගිණුම් හිඟයක් පැවති යුගයට තිත තබමින් විදේශ අංශයේ ජංගම ගිණුමෙහි ස්ථාවර ශේෂයක් අපේක්ෂා කරනවා. ඒ අනුව, වෙළඳපොළ මූලධර්ම මත පදනම් වූ අපගේ විනිමය අනුපාතය තවදුරටත් ඉහළ උච්ඡාවචනයන්ට ලක් නොවනු ඇතැයි අපි අපේක්ෂා කරනවා.

2025 දී භාණ්ඩ හා සේවා අපනයනය ඩොලර් බිලියන 19කට ආසන්න වාර්තාගත ඉහළම මට්ටමක් අපි අපේක්ෂා කරනවා. ශක්තිමත් අපනයන අංශයක් මඟින් ආර්ථික වර්ධනය තවදුරටත් ඉහළ යනු ඇතැයි බලාපොරොත්තු වනවා. ශක්තිමත් ආර්ථික වර්ධනයක් සමඟින් ණය නොවන ගලාඒම්වල වර්ධනය සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3 ක රාජ්‍ය අය වැයෙහි ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීම මඟින් ශ්‍රී ලංකාව 2028 වසරේ සිට ක්‍රමානුකූලව වැඩි වන ණය සේවාකරණ ගෙවීම් සඳහා ඉතා හොඳ සූදානමක සිටින බව තහවුරු කරනවා.

ලෝක බැංකු ඇස්තමේන්තුවලට අනුව, 2023 වසරේ දී රටේ දරිද්‍රතා අනුපාතය සියයට 25.9 ක්. ස්වෛරීත්ව ණය පැහැර හැරීමට ලක් වූ බොහෝ රටවල් දිළිඳුකමෙන් දිගු කාලසීමාවක් අත්විඳින අතර, 2025 වසර වන විට මෙම ප්‍රවණතාව ආපසු හැරීමක් දැකීමට අපි බලාපොරොත්තු වෙනවා. මෙම අය වැය යෝජනා මඟින් සමාජයේ දිළිඳුම සහ වඩාත්ම අවදානමට ලක් විය හැකි සාමාජිකයන් සවිබල ගැන්වීමේ පුළුල් ප්‍රයත්නයකට පළමු පියවර තබන අතර, දරිද්‍රතාවයේ අඛණ්ඩ අඩුවීමක් අපේක්ෂා කරනවා.

සමාජයේ දිළිඳුම සහ වඩාත්ම අවදානමට ලක් විය හැකි සාමාජිකයන් සවිබල ගැන්වීමේ පුළුල් ප්‍රයත්නයකට පළමු පියවර තබන අතර, දරිද්‍රතාවේ අඛණ්ඩ අඩුවීමක් අපේක්ෂා කරනවා.

නිසි මුදල් කළමනාකරණය, වගකීමෙන් යුතුව ණය කළමනාකරණය කිරීම මානව ප්‍රාග්ධනය සඳහා වූ ආයෝජන, ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාල, ආර්ථික විවිධාංගීකරණය, අපනයන ප්‍රවර්ධනය, ආයෝජන පරිසරයෙහි වර්ධනය, කෘෂිකර්මාන්තය නවීකරණය, හරිත ආර්ථික ප්‍රතිපත්ති, නවෝත්පාදන, ඩිජිටල්කරණය, ව්‍යවසායකත්වය සහ නව ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කරදීම, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය, දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සහ විනිවිදභාවය සහ තිරසර වර්ධන ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරීම මඟින් දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සහ සමෘද්ධිය ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආර්ථිකයේ පරිවර්තනීය වෙනසක් ඇති කිරීම සඳහා පශ්චාත් අර්බුද අවස්ථාව වඩාත් හොඳින් යොදා ගැනීමට අප අපේක්ෂා කරනවා.

මම දැන් මේ පාර්ලිමේන්තුවට 2025 අය වැය යෝජනා ඉදිරිපත් කරනවා.

1. භාණ්ඩ හා සේවා අපනයනය පුළුල් කිරීම

ශ්‍රී ලංකාවේ ගෝලීය වෙළෙඳපොළවලට අපනයනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම මඟින් ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා අපනයන හැකියාව මහා පරිමාණයෙන් වැඩි කිරීමේ අරමුණින් රජය ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් (2025-2029) සකස් කරනු ඇත. නව අපනයන වෙළෙඳපොළ අත්පත් කර ගැනීමට, පවතින වෙළෙඳපොළ පුළුල් කිරීමට හෝ මහා පරිමාණ අපනයනකරුවන්ගේ අගය දාමයන් සහ ගෝලීය අගය දාමයන් සමඟ සම්බන්ධ වීමට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (MSMEs) හට පහසුකම් සැලසෙනු ඇත.

උසස් තත්ත්වයේ, දැරිය හැකි මිලකට ලබා ගත හැකි අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශ වීමේ සීමාවන් ඉවත් කිරීමේ අරමුණින්, සරල, විනිවිද පෙනෙන සහ පුරෝකථනය කළ හැකි තීරුබදු රාමුවක් නිර්මාණය කිරීම සඳහා ජාතික තීරු බදු ප්‍රතිපත්තියක් මත පදනම්ව නව තීරු බදු නිර්ණය වේ.

විශේෂයෙන් කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) සහ අනෙකුත් ගිවිසුම් හරහා ආසියාන් (ASEAN) සංවිධානයේ රටවල් සමඟ ආර්ථික සබඳතා වැඩිදියුණු කිරීමේ අරමුණින්, උපායමාර්ගික හවුල්කරුවන් සමඟ ශ්‍රී ලංකාවේ නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA) ජාලය පුළුල් කිරීම සඳහා කටයුතු කරනවා.

අපගේ භාණ්ඩ හා සේවා අපනයනය වැඩිදියුණු කිරීම සඳහා අපගේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල කැපවූ සහ වඩාත් වෘත්තීයමය උත්සාහයන් සමඟ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

අපගේ අපනයනකරුවන් සමඟ විදේශීය ව්‍යාපාරික ජාල, වාණිජ අවස්ථා සහ වාණිජ සහයෝගිතාව වැඩිදියුණු කළ හැකිවන ප්‍රවේශයක් සඳහා විදේශගත ශ්‍රී ලාංකික ප්‍රජාව යොදා ගන්නවා.

ප්‍රධාන විදේශ වෙළඳාම සම්බන්ධ ආයතන (key border agencies) සහ අපනයනකරුවන් ලියාපදිංචිය ස්වයංක්‍රීයකරණය හා ඩිජිටල්කරණය කිරීම තුළින් ජාතික තනි වෙළෙඳ කවුළුව (TNSW) ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

ආදායම් එකතු කිරීම හා වෙළෙඳ පහසුකම් කාර්යක්ෂම කිරීමට නව රේගු පනතක් හඳුන්වා දීමට කටයුතු කරනවා.

ශ්‍රී ලංකාවේ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් (DTA) දැනට පවතින ද්විත්ව බදුගිවිසුම් 44 න් ඔබ්බට පුළුල් කරනු ලබන අතර එහි දී ඉහළ වෙළෙඳ හා ආයෝජන විභවයක් ඇති රටවලට ප්‍රමුඛතාව දෙනු ලබනවා.

2. ආයෝජන ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම

අපනයන කේන්ද්‍ර කරගත් ආයෝජන සහ විශේෂිත අංශයන් සඳහා වන කලාප පුළුල් කිරීම, තිරසර භාවිතයන්, සම්පත් කළමනාකරණය සහ හරිත තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන පරිසරහිතකාමී කාර්මික උද්‍යාන පිහිටුවීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය සහ පෞද්ගලිකව පවත්වාගෙන යනු ලබන කලාප හරහා රජය සිය සහයෝගය ලබා දෙනු ලැබේ.

නැඟී එන ආයෝජන වර්ධනයන්ට ගැළපෙන පරිදි ආර්ථික පරිවර්තන පනත සංශෝධනය කෙරෙනු ඇත.

ඵලදායී ආර්ථික කටයුතු සඳහා රජය විසින් භාවිත නොකළ රජය සතු ඉඩම් ඵලදායි ආර්ථික කටයුතු සඳහා බදු දෙනු ඇත.

ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ සහ ආරක්ෂාව සැපයීමේ අරමුණින් ආයෝජන ආරක්ෂණ පනතක් සම්මත කරනු ලැබේ.

දේපළ ලියාපදිංචි කිරීම, බදු ගෙවීමේ පහසුව, වෙළෙඳ පහසුකම් සැපයීම, කොන්ත්‍රාත්තු බලාත්මක කිරීම, ණය ලබා ගැනීම වැනි ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළව රටේ ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිදියුණු කිරීමට කටයුතු කෙරේ. රාජ්‍ය සේවාවන් ඩිජිටල්කරණය සඳහා වන පියවර මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

සෑම පියවරක් සඳහාම නිශ්චිත කාල රාමු සැකසීම සහිතව, අවශ්‍ය වන සියලු අනුමැතීන් ඒකාබද්ධව ලබා ගත හැකිවන පරිද්දෙන් 'එක් ස්ථානයකින් සියලු සේවා' (one stop shop) යන සංකල්පය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නීති සම්පාදනය කරනු ලැබේ.

ඉපැයීම් සහ ලාභාංශ නැවත මෙරටට ගෙන්වා ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා සුදුසු ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමෙන් දේශීය සමාගම් හට විදේශයන්හි ආයෝජනය කිරීමට ඇති බාධක සමාලෝචනය කර ඒවා ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීමට කටයුතු කරනවා.

රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) සම්බන්ධව නව පනතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ඉඩම් හිමිකම් සංවර්ධනයට සහ ඉඩම්වල වාණිජමය භාවිතය වැඩි කිරීම සඳහා බිම්සවිය වැඩසටහන කඩිනම් කරනවා.

දැනටමත් කෙටුම්පත් අදියරවල පවතින බංකොලොත්භාවය පිළිබඳ පනත් කෙටුම්පතේ කටයුතු කඩිනම් කරනවා.

ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් සහ සමුද්‍ර ආර්ථිකයේ ආයෝජන, කාර්මික සංවර්ධනය සහ අපනයන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනයට නොගත් විභවයන් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සඳහා රජය සෘජු විදේශ ආයෝජන අපේක්ෂා කරනවා.

අපනයනකරුවන්ට තත්ත්ව පරීක්ෂණ සහ සහතිකකරණය ලබා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය සහාය රජය විසින් ලබා දෙනවා.

පරීක්ෂණ සහ ක්‍රමාංකන රසායනාගාර, යොමු කිරීමේ මධ්‍යස්ථාන, පිළිකා කාරක පර්යේෂණ සඳහා යොමු කිරීමේ මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල සහ කාර්මික තාක්ෂණ ආයතනය ඇතුළු අනෙකුත් තක්සේරු ආයතන සේවාදායකයින් සඳහා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා සංවර්ධනය කරනවා. රට තුළ ජාතික තත්ත්ව කළමනාකරණ පද්ධතියේ අපේක්ෂිත ප්‍රතිඵල සපුරාලීමට, 2025 වසර සඳහා රුපියල් මිලියන 750 ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

3. ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම උපයෝගී කර ගැනීම

ශ්‍රී ලංකාවට වෙළෙඳාම, භාණ්ඩ සේවා සැපයුම්, මූල්‍ය සේවා සහ ඩිජිටල් ආර්ථිකය සඳහා කේන්ද්‍රස්ථානයක් වීමට හැකියාව තිබෙනවා. මෙම අය - වැය තුළින් මෙකී විභවයන් සපුරාලීම සඳහා මූලික පියවර සපයනවා.

රටේ උපායමාර්ගික භූගෝලීය පිහිටීම උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛතම බලවේගයක් ලෙස කටයුතු කිරීමට භාණ්ඩ සේවා පහසුකම් සැලසීමේ අංශය සැලකිය යුතු විභවයක් දරනවා. වර්තමානයේ, මෙම භාණ්ඩ සේවා පහසුකම් සැලසීමේ අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් ආසන්න වශයෙන් සියයට 2.5ක් සහ අපනයන සඳහා සියයට 7ක දායකත්වයක් ලබා දෙන අතර ඇස්තමේන්තුගත පුද්ගලයින් 40,000 සිට 50,000කට සෘජු, පූර්ණ කාලීන රැකියා සපයයි.

වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය අඛණ්ඩව ක්‍රියාත්මකයි. ඒ සඳහා රජය 2025 වසරට රුපියල් මිලියන 35,000ක් වෙන් කර තිබෙනවා.

නැඟෙනහිර සහ බටහිර බහලුම් පර්යන්ත ව්‍යාපෘති අවසන් වූ පසු කොළඹ වරායේ සැලකිය යුතු ධාරිතාවක් වර්ධනය වනු ඇත. ඊට අමතරව, යෝජිත කොළඹ බටහිර පර්යන්තය සහ කොළඹ උතුරු වරාය ශ්‍රී ලංකාවේ වරායවල ක්‍රියාකාරිත්වය වේගවත් කරනු ඇතැයි අපේක්ෂා කරනවා. මාසයක් ඇතුළත, එම ව්‍යාපෘති සඳහා අභිලාෂයන් ප්‍රකාශ කිරීම් (EOI) කැඳවීමට අප කටයුතු කරනවා.

බහලුම් පරිමාවන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බැවින් කොළඹ වරාය දැනට දැඩි තදබදයකට මුහුණ දීම නිසා, යටිතල පහසුකම් සහ පද්ධති සහ ක්‍රියා පටිපාටිවල තීරණාත්මක සංවර්ධනයක් අවශ්‍ය වී තිබෙනවා. එබැවින්, කෙරවලපිටිය රේගු පරීක්ෂණ අංගණයේ සහ බිලූමැන්ඩල් භාණ්ඩ සේවා සැපයුම් උද්‍යානයේ මූලික සූදානම් කිරීමේ කටයුතු සඳහා සහාය වීම පිණිස 2025 අය-වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

කොළඹ වරාය තුළ සහ ඒ අවට බහලුම් රථවාහන තදබදය ලිහිල් කිරීම සහ අගය එකතු කිරීම තුළින් විදේශ ඉපැයීම් වැඩි කිරීම සඳහා දිගුකාලීන පියවරක් ලෙස, දුම්රිය පාදක ඒකාබද්ධ බහුමාධ්‍ය භාණ්ඩ හා සැපයුම් මධ්‍යස්ථානයක් (IMCLC) ලෙස වේයන්ගොඩ අභ්‍යන්තර බහලුම් අංගණයක් (ICD) ස්ථාපිත කිරීමට යෝජනා කරනවා. ඒ සඳහා ආයතනික යන්ත්‍රණයක් හඳුනා ගැනීම, ඉඩම් අත්පත් කර ගැනීම සහ අනෙකුත් මූලික සූදානම් කිරීමේ කටයුතු සඳහා සහාය වීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

ජාතික තනි කවුළු පද්ධතිය, ට්‍රක් රථ පැවරීමේ පද්ධතිය (Truck Appointment System), විදුත් බහලුම් නිරීක්ෂණ (Tracking System) සහ "වරාය ප්‍රජාවර තොරතුරු හුවමාරු පද්ධතිය (Port Community System) සංවර්ධනයට සහාය වීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

භාණ්ඩ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ අති නවීන තාක්ෂණය ඇතුළත් කිරීම ඉතා වැදගත්. යල් පැන ගිය පරිලෝකන (scanning) පද්ධති සමස්ත සැපයුම් දාමයේ ප්‍රමාදයන්ට හේතුවක්. එබැවින්, කොළඹ වරාය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සඳහා උසස් පරිලෝකන පද්ධතිවල මූලික සංවර්ධනය සහ ස්ථාපිත කිරීමට සහාය වීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

4. ඩිජිටල් ආර්ථික දියුණුව

ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකයේ සංවර්ධනය වේගවත් කිරීම අපගේ ආර්ථික සංවර්ධන උපායමාර්ගයේ වැදගත්ම අංගයක්. කාර්මික හා සේවා අංශ තුළ ඵලදායිතාව වැඩි දියුණු කිරීම, ආර්ථික අවස්ථා ප්‍රවර්ධනය කිරීම, රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ පාලනයේ සහ රාජ්‍ය මූල්‍යයේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම තුළින්, ඩිජිටල් පරිවර්තනය, ආර්ථික වර්ධනය ඉහළ නංවනු ඇත.

සියලුම පුරවැසියන් සඳහා ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හඳුනා ගැනීම (SL-UDI) ස්ථාපිත කිරීම ප්‍රමුඛතාවකි. SL-UDI යනු ඩිජිටල් ආර්ථිකයක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය මූලික ඩිජිටල් පොදු යටිතල පහසුකම් (DPI) වේ. මෙම ක්‍රියාවලිය සඳහා වන පියවර දැනටමත් ආරම්භ කර ඇති අතර මෙම ක්‍රියාවලිය කඩිනම් කෙරෙනු ඇතැයි අපේක්ෂා කරනවා.

ඩිජිටල් සේවා සහ පද්ධතිවල ආරක්ෂාව සහ අඛණ්ඩතාව පිළිබඳ මහජන සහ ආයතනික විශ්වාසය ඩිජිටල් පරිවර්තනයේ සාර්ථකත්වය සහ තිරසරභාවය සඳහා ඉතා වැදගත්. නව නීති සම්පාදනය කිරීම සහ පවතින නීති ශක්තිමත් කිරීම හරහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය පාලනය කර ආරක්ෂා කරනු ලබනවා. අදාළ ආයතනික රාමුව ශක්තිමත් කිරීම කෙරෙහි ද අපි අවධානය යොමු කරනවා. ඩිජිටල් ආර්ථිකය තවදුරටත් වේගවත් කිරීම සහ ඩිජිටල් පද්ධතියේ අනෙකුත් විෂය අනුබද්ධ ආයතන මෙන්ම ඉහළ මට්ටමේ ඩිජිටල් ආර්ථික අධිකාරියක් බලගැන්වීම සඳහා අපි නව නීති සම්පාදනය කරනවා. සයිබර් ආරක්ෂාව, දත්ත රහස්‍යතාව සහ දත්ත ආරක්ෂණයට අදාළ නීති සහ ආයතන ද අප ශක්තිමත් කරනවා.

ඩිජිටල් ගෙවීම් යටිතල පහසුකම් ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථික රාමුවේ තවත් මූලික අංගයක්. රජය, ව්‍යාපාර සහ පුරවැසියන් අතර ගලා යන ඩිජිටල් ගෙවීම් වේගවත් කිරීමට අපි කටයුතු කරනවා. මෑතකදී දියත් කරන ලද GovPay පද්ධතිය මීට උදාහරණයක්. මුදල් නෝට්ටු පදනම් කරගත් ආර්ථිකයෙන් ක්‍රමයෙන් ඉවත් වීම අවශ්‍ය වෙනවා. එය පැහැදිලි සන්නිවේදනයක් සහිතව, ප්‍රවේශමෙන් අදියර කිහිපයකින් යුක්තව ක්‍රියාත්මක වනු ඇත.

ඩිජිටල් ආර්ථිකයේ සියලුම අංශ හරහා පුද්ගලික ප්‍රාග්ධනය සහ හවුල්කාරිත්වයන් ආකර්ෂණය කර ගැනීම වෙනුවෙන් රජය හිතකර ආයෝජන පරිසරයක් සඳහා පහසුකම් සපයනු ඇත. මෙමඟින් කෘත්‍රිම බුද්ධිය, රොබෝ විද්‍යාව, මූල්‍ය තාක්ෂණය සහ අනෙකුත් නැඟී එන තාක්ෂණයන්හි නවෝත්පාදනයන් සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට උපකාර කරයි.

ඉදිරි වසර පහ තුළ ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය අමෙරිකානු ඩොලර් බිලියන 15 ඉක්මවන මට්ටමකට හෝ ජාතික ආර්ථිකයෙන් සියයට 12කට වඩා වැඩි මට්ටමකට වර්ධනය කිරීම අපගේ අරමුණයි. මෙම අභිලාෂය සාක්ෂාත් කර ගැනීමේදී රජය පරිගණක හා තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වාර්ෂික අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීමට පහසුකම් සැලසීම ඉලක්ක කරනවා.

ඒ අනුව, විස්තර කර ඇති මූලපිරීම් හරහා ඩිජිටල් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

5. සංචාරක අංශය

සංචාරක පැමිණීම් සංඛ්‍යාව කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම වෙනුවට සංචාරක ව්‍යාපාරයෙන් ජනනය වන වටිනාකම් කෙරෙහි අවධානය යොමු කිරීම සහතික කිරීම අවශ්‍ය වෙනවා.

මේ සඳහා, අවශ්‍ය යටිතල පහසුකම් සහිතව එම ගමනාන්තයන්ට අනන්‍ය වූ සංස්කෘතික වටිනාකම් පිළිබිඹු කිරීම සඳහා එම ගමනාන්ත දේශීය සන්නාමකරණයක් සමඟ එක් එක් ගමනාන්තයෙන් වටිනාකම් උත්පාදනය ප්‍රශස්ත කිරීම සඳහා දේශීය ගමනාන්ත සංවර්ධනය කිරීමට පියවර ගනු ලබනවා. හඳුනා ගැනීමෙන් පසුව, අවශ්‍ය තීරණාත්මක යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් 2025-2026 වසර 2ක කාලය තුළ ප්‍රමුඛතා පදනමක් මත සිදු කරනු ඇත. මෙම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සංවර්ධිත ගමනාන්ත සඳහා ඒකාබද්ධ නගර නාමකරණ සහ ප්‍රවර්ධන ව්‍යාපාරයකින් සහාය වනු ඇත. මේ සඳහා 2025 වසර සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

සංචාරක ක්ෂේත්‍රයේ, සන්නිවේදනය සහ අනෙකුත් කුසලතා පිළිබඳ තරුණ තරුණියන් පුහුණු කිරීම සඳහා රජය පහසුකම් සපයනු ඇත.

7 පිටුවට

දොඩම්පේ ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත
ඩී. එල්. ධර්මවර්ධන මහතා අභාවප්‍රාප්ත විය

ලේක්හවුස් පුවත්පත් අලෙවි නියෝජිත
ඩී. එල්. ධර්මවර්ධන මහතා
2025.02.16 දින අභාවප්‍රාප්ත විය.
ඒ පිළිබඳ අවසන් කටයුතු
2025.02.19 වන බදාදා දින
පවුලේ සුසාන භූමියේදී සිදුකෙරේ.
අලෙවි දෙපාර්තමේන්තුව - ලේක්හවුස්